# අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව කලින් දැන සිටි බවට කෙරෙන ප්‍රකාශ සම්පූර්ණයෙන් ම අසත්‍යය ය

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් 2019 අප්‍රේල් 21 වන පාස්කු ඉරුදින උදය දිව්‍ය පූජාවකට සහභාගි නොවූයේ එදින එල්ල වන බෝම්බ ප්‍රහාරය පිළිබඳව කලින් දැන සිටි නිසා බව ප්‍රකාශ කරමින් මේ දිනවල සමාජ මාධ්‍ය ඔස්සේ සංවිධානාත්මක අසත්‍ය ප්‍රකාශයක් සංසරණය වෙමින් පවතියි.

මේ අසත්‍ය ප්‍රකාශය පළමුවෙන් ම සමාජගත වීමට පටන් ගැනුනේ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හරින් ප්‍රනාන්දු විසින්, පාස්කු විමර්ශනය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවට 2020 වසරේ දී කරන ලද ප්‍රකාශයක් ඔස්සේ ය. එම ප්‍රකාශය සම්පූර්ණයෙන් ම අසත්‍ය ප්‍රකාශයක් බව 2020 සැප්තැම්බර් 19 දින කොළඹ අගරදගුරු පදවියේ සහයක රදගුරු හිමිවරුන් තිදෙනාගේ අත්සනින් යුතු මාධ්‍ය ප්‍රකාශයක් ඔස්සේ පැහැදිලි කෙරිණි.

එම ප්‍රකාශයේ මෙසේ සඳහන් වේ:

''අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ සිරිත් පරිදි පාස්කු රාත්‍රි මෙහෙය අප්‍රේල් 20 වන සෙනසුරාද සිය ආසන දෙව්මැඳුර වන කොළඹ කොටහේන සා. ලුසියා දෙව්මැඳුරේදී සිදුකළ අතර මධ්‍යම රාත්‍රිය ඉක්මවා පසු දින පාන්දර 2.00 පමණ වනතුරු පැවැත්වුණු එම දේව මෙහෙයට හා දිව්‍ය පූජාවට අමතරව බෝම්බ ප්‍රහාරය සිදුවූ අප්‍රේල් 21 වන පාස්කු ඉරුදින උදෑසන ද උන්වහන්සේ විසින් අගරදගුරු නිවසේ දී දිව්‍ය පූජාව පවත්වන ලදී. කොළඹ කොච්චිකඩේ සා. අන්තෝනි දෙව්මැඳුරේ සිදුවූ බෝම්බ පිපිරීම පිළිබඳව උන්වහන්සේට පළමුවෙන් ආරංචි වන්නේ පාස්කු ඉරුදින උන්වහන්සේ සිදුකළ මෙම දෙවන දිව්‍ය පූජාව නිම වී සිය කුටිය වෙත පෙරළා පැමිණි පසුය. සිද්ධිය සැල වූ වහාම උන්වහන්සේ විපතට පත් ජනතාව බැලීමටත් තමන්ට හැකි අන්දමින් ඔවුන් සැනසීමටත් කොළඹ කොච්චිකඩේ සා. අන්තෝනි දෙව්මැඳුර වෙත ගියේ සිය සහයක රදගුරුතුමන් වන අති උතුම් ජේ. ඩී. ඇන්තනි හිමිපාණන් ද කැටුවය. ''

එහෙයින් සමාජ මාධ්‍ය ඔස්සේ මෑතක සිට සංසරණය වන මෙම ප්‍රකාශ පදනම් විරහිත සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශ බව අපි අවධාරණය කරමු.

එසේම පාස්කු ඉරිද ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳව සියලු ප්‍රභූ ආරක්ෂක අංශ වෙත කලින් දැනුවත් කර තිබූ බවත් ඒ අනුව කාදිනල් හිමිපාණන්ගේ ආරක්ෂාව සඳහා යොදවා තිබූ ප්‍රභූ ආරක්ෂක නිලධාරින් මාර්ගයෙන් කාදිනල් හිමිපාණන් මේ පිළිබඳව දැනුවත්ව සිටි බවත් සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන ඇතැම් ප්‍රකාශවල සඳහන් වෙයි.

අති උතුම් කාදිනල් හිමිපාණන් හට ආරක්ෂාව සැපයීම සිදුවූයේ පාස්කු ඉරිද ම්ලේච්ඡ ප්‍රහාරයෙන් පසුව බව මෙහිදී අවධාරණය කළ යුතු ය. ඉන්පසු දිගටම එම ආරක්ෂාව සපයන ලෙස, ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරිණි. ඉන් පෙර කොළඹ අගරදගුරු මැදුරට හෝ කාදිනල් හිමිපාණන් හට කිසිදු ආරක්ෂාවක් රජයේ ආරක්ෂක අංශ වෙතින් සපයා නොතිබුණු බවද අවධාරණය කරමු.

මේ අසත්‍ය ප්‍රචාර සහ මඩගැසීම් සියල්ලේම අරමුණ වී ඇත්තේ පාස්කු ඉරිද ම්ලේච්ඡ ප්‍රහාරයේ සත්‍ය එළිදරව් කරගනිමින්, සැබෑ අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒම සඳහා සිදුකෙරෙමින් පවතින විමර්ශනවලට බාධා කර ඒවා කඩාකප්පල් කිරීමේ දුෂ්ට අරමුණින් බව හොඳින්ම පෙනෙන්නට ඇති කාරණයකි.

එහෙයින් සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන කිසිදු පදනමකින් තොර මෙවැනි අසත්‍ය ප්‍රකාශයන්ට නොරැවටෙන ලෙස අපි මේ රටේ සබුද්ධිමත් ජනතාවගෙන් ඉල්ලා සිටිමු.

**ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා**
කාදිනල් හිමිපාණන්ගේ මාධ්‍ය ප්‍රකාශක
2026. 06. 17